# පෞද්ගලික ආයෝජන සමීක්ෂණය

පෞද්ගලික ආයෝජන පිලිබඳව, මහ බැංකුව පවත්වන දෙවෙනි දීප ව්‍යාප්ත සමීක්ෂණය 1967 නොවැම්බරයේ දී ආරම්භ කරන ලදී. මෙම සමීක්ෂණය කරන ලද්දේ 1963 අප්‍රියෙල් 1 වෙනි ද සිට 1964 මාර්තු 31 වැනි ද දක්වා කාලපේදය තුල කරණ ලද පලමුවෙනි පුද්ගලික ආයෝජන සමීක්ෂණයෙන් සොයා ගත් තොරතුරු වලට අතිරේකයක් වශයෙනි. මුල් සමීක්ෂණයේ ප්‍රතිඵල මහ බැංකුවේ 1965 අගෝස්තු, නොවැම්බර් හා දෙසැම්බර් විවරණිකා වල හා 1966 මාර්තු විවරණිකාවේ පල කරන්නට යෙදිණ.

මේ අන්දමේ සංඛ්‍යා තොරතුරු, ජාතික ආදායම් විශ්ලේෂනයට, ආර්ථික ක්‍රම සම්පාදනයට හා ප්‍රතිපත්ති සකස් කිරීමට අතිශයින් වැදගත් නිසා මෙවැනි සමීක්ෂණ වඩාත් නිරතුරුව පැවැත්වීමට මහ බැංකුව අදහස් කරයි.

දැන් කර ගෙන යන සමීක්ෂණය ද පසුගිය සමීක්ෂණය අනුවම සකස් කරන ලද අතර, අර්ථ ක්‍රමයේ පහත දැක්වෙන විවිධ අංශ අලලා සැකසුණු උප සමීක්ෂණ මාලාවක් මගින් එය පවත්වා ගෙන යනු ලැබේ.

(අ) සමාගම්
(ආ) සමාගම් නොවන ආයතන
(ඇ) නාගරික පවුල්
(ඈ) ග්‍රාමීය පවුල්
(ඉ) ධීවර පවුල්

රැස් කල තොරතුරු:

ප්‍රශ්න මාලාව සකස් කරන ලද්දේ ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ සහ සංගණන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ නියෝජිතයන්ගේද අදහස් විමසීමෙන්ය. ධීවර පවුල් හැර අනෙකුත් සියලුම උප සමීක්ෂණ වලදී ඉඩම්, නිවාස, නිවාස නොවන තැනීම්, කාර්යාල උපකරණ ගෘහ භාණ්ඩ, යන්ත්‍රෝපකරණ යන අංශවල කරන ලද ආයෝජන පිළිබඳ තොරතුරු ලබා ගැණින. යන්ත්‍රෝපකරණ පිළිබඳව කරන ලද ආයෝජන වියදම් දේශීය හා විදේශීය වශයෙන් කොටස් දෙකකට වෙන් කිරීමට ප්‍රයත්න කරනු ලැබේ. කර්මාන්ත සහ සේවා අංශවල දී නිමවූ භාණ්ඩ, අඩක් නිමවූ භාණ්ඩ, ඉන්ධන හා අමුද්‍රව්‍ය තොගයන් පිළිබඳ තොරතුරු එකතු කරන්නට යෙදින. කෘෂිකාර්මික අංශයේදී නව වගා කිරීම්, නැවත වගා කිරීම් හා ලාබාල වගාවන් පවත්වා ගෙන යාමට කල වියදම් හා සත්ව පාලනය පිළිබඳ තොරතුරු රැස් කෙරින. ධීවර සමීක්ෂණයේදී බෝට්ටු, දැල්, මුහුදු යාත්‍රා යනාදිය මිළදී ගැනීම, තැනීම හා දියුණු කිරීම පිළිබඳ තොරතුරු සොයන ලදී. තවද සියලුම උප සමීක්ෂණ වල දී මුදල් ලබා ගත් මූලය අනුව වර්ග කිරීමට ප්‍රයත්න කරන ලදී නිෂ්පාදන සම්බන්ධ තොරතුරු සොයන ලද්දේ, සමාගම් හා සමාගම් නොවන ආයතන වලින් පමණය. අනෙක් අංශ වලින් විශ්වාස කටයුතු තොරතුරු ලබා ගැනීම පුළුවන්වේ යයි කල්පනා නොකල බැවිනි.

පිරි වැස්ම

සමාගම්, සමාගම් නොවන ආයතන; කෘෂිකාර්මික, නිපැදවීමේ කර්මාන්ත, සහ සේවා යනුවෙන් ස්තර තුනකට බෙදන ලදී. කාර්මික සමාගම් සම්බන්ධයෙන් හැම ආයතනයකම තොරතුරු එකතු කිරීමට උත්සාහ කල අතර, අනෙකුත් ස්තර වලදී ඒ ඒ ස්තරයෙන් තෝරා ගත් සසම්භාව්‍ය

නියැදියකි, පරීක්ෂණය සඳහා උපයෝගි කර ගන්නා ලද්දේ. නාගරික අංශය සැකසුනේ මහ නගර සභා සහ නගර සභා වලිනි; සුළු නගර සභා ඇතුළත් නොකරන ලදී. මෙම අංශයේ නියැදි රාමුව සඳහා යොදා ගන්නා ලද්දේ සංගණන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව ජන සංඛ්‍යාව සම්බන්ධයෙන් යොදා ගනු ලැබූ සංගණන කාණ්ඩයය. ග්‍රාමීය සමීක්ෂණයේදී, ජන සංඛ්‍යාවේ හා පවුල්වල මුළු ගණනට සරිලන පරිමානුකූල සම්භාවිතාවයකින් ඒ ඒ දිස්ත්‍රික්ක වලින් ගම් තෝරා ගන්නා ලද අතර, තෝරා ගත් ගම්වල සියළු පවුල් සම්බන්ධ තොරතුරු සොයන ලදී. පළමුවැනි ආයෝජන සමීක්ෂණයේදී කලාසේම ධීවර පවුල් සම්බන්ධයෙන් ද මෙම නියදි ක්‍රමය යොදන ලදී. එනම්, ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ධීවර පළාත් සම්බන්ධ නියැදියක් සරි කරණ ලදී.

ආයෝජන සංඛ්‍යා මාලාවක්, සම්පාදනය කිරීම් වස් 1964 අප්‍රියෙල් 1 සිට 1967 මාර්තු 31 දක්වා අවුරුදු තුනක කාලජේදය සඳහ සංඛ්‍යා තොරතුරු සැපයීමට සමාගම් හා සමාගම් නොවන ආයතන වලින් ඉල්ලුම් කෙරිනි. නාගරික, ග්‍රාමීය හා ධීවර සමීක්ෂණ වලදී මුල් කාලජේද පිළිබඳ විශ්වාසදායක තොරතුරු සොයා ගැනීමට අපහසු යයි හැඟුන හෙයින් 1966 අප්‍රියෙල් 1 සිට 1967 මාර්තු 31 දක්වා කාලජේදයට අයත් තොරතුරු පමණක් රැස් කෙරුනි.

සමාගම් ආයතන හා සමාගම් නොවන ආයතන වලට ප්‍රශ්න මාලාවක් තැපෑලෙන් යවන ලද අතර අවශ්‍ය තන්හිදී ද පුද්ගලිකව හමුවී ප්‍රශ්ණ කරනු ලැබීය. නාගරික, ග්‍රාමීය හා ධීවර සමීක්ෂණයත්, පුද්ගලිකව ප්‍රශ්න ඇසීම් මගින් පවත්වා ගෙන යනු ලැබේ. මෙම සමීක්ෂණවල ක්ෂේත්‍ර කටයුතු දැනට කරගෙන යන අතර සුලු කාලයකින් එය අවසන් කිරීමට බලාපොරොත්තු වෙයි.